ශ්‍රී ලංකා තක්සේරු කරුවන්ගේ ආයතනය
---------------------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර, 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.2.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 04 දින ඉදිරිපත්කර තිබුණි.

#### 1.2.2 <u>උසස් ගිණුම්කරණ පරිචයන්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උසස් ගිණුම්කරණ පරිචයන් අනුව ආදායම් හා වියදම් ගිණුම හා ශේෂ පත්‍රය පිළියෙල කර නොතිබුණි.

(ආ) ක්ෂය කිරීම් ප්‍රතිපත්ති, තොග ගණනය කිරීමේ පදනම හා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් අනෙකුත් ප්‍රමිතීන් හෝ ප්‍රතිපත්තීන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) කල්බදු පදනම මත මිලදී ගත් දේපල ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් යොදාගත් ගිණුම්කරණ පරිචයන් පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) තොග ආගණනය පිරිවැය මත කළ යුතු වුවත් විකුණුම් මිල මත ගණනය කර තිබුණි.

**1.2.3 <u>ගණකාධිකරණ අඩුපාඩු</u>**

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ගොඩනැගිලි අරමුදල වෙනුවෙන් ආධාර වශයෙන් සාමාජිකයන්ගෙන් ලැබී ඇති රු. 21,240 ක් ගොඩනැගිලි අරමුදල ගිණුම් ලෙස ගිණුම් ගත කළ යුතු වුවත්, ආධාර ලැබීම් ලෙස දක්වා තිබුණි.

(ආ) සුභපැතුම් පත් මුද්‍රණය කිරීම් සඳහා ගෙවිය යුතු රු. 17,500 ක උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කල යුතු වුවත් එසේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) යහසාධක අරමුදලට අදාල රු.320, 000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

**1.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

වවුචර්, ලේඛන , සත්‍යෝක්ෂණ වාර්තා , ඉන්වොයිස්, ලදුපත් හා සනාථ කිරීම් වැනි සාක්ෂි නොවීම හේතුවෙන් එකතුව රු. 583,392 ක් වූ අවසාන තොග, බැංකු ගිණුම් ශේෂ 2 ක්, සුළු මුදල් අග්‍රිමය හා ගෙවීම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.2.5 <u>නීති, රීති, සහ රෙගුලාසි වලට අනුකූල නොවීම</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| <u>නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| **(අ) 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනත** | |
| (i) 9 (2) (අ) වගන්තිය | එක් සාමාජිකයෙක් පාලක මණ්ඩල අනුපූර්ව රැස්වීම් 5 කට සහභාගි වී නොතිබුණි. තවද එක් සාමාජිකයෙක් 2010 වර්ෂයේදී පාලක මණ්ඩල රැස්වීම් එකකටවත් සහභාගි වී නොතිබුණි. |
| (ii) 28 වගන්තිය | ආයතනයේ මූලික ප්‍රාග්ධනය රු.150,000 ක් විය යුතු වුවත රු.110,000 ක් පමණක් අරමුදලෙහි දැක්වුනි. |

| | |
|---|---|
| (iii) "අ" උපලේඛනය 5 (2) වගන්තිය | සාමාජිකයන් 23 දෙනෙක් විසින් වසර 2ක් සාමාජික ගාස්තු ගෙවා නොතිබුණද ඔවුන්ගේ නම් සාමාජික නාමලේඛණයෙන් ඉවත් කර නොතිබුණි. |
| (ආ)1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 පරිච්ඡේදය හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුල් පනත. | සේවකයන්ගේ මාසික වැටුපෙන් අඩුකල යුතු දායකමුදල අඩුකර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ දායක මුදල සමඟ ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි | |
| 261 (3) හා 446 (2) | මුදල් පොත් ශේෂයන් දිනපතා හා මාසිකව සහතක කර නොතිබුණි. |
| (ඉ) 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5 වගන්තිය | ආයතනය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය සමාලෝචනය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.848,898 ක ශුද්ධ අතිරික්තයක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.166,284 ක ශුද්ධ අතිරික්තයක් වුයෙන් රු. 682,614 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමක් දැක්වුණි. මෙම වැඩිවීම සඳහා අවසන් තොගය, සම්මන්ත්‍රණ ආදායම් හා ස්ථාවර තැන්පතු පොලී ආදායම් වැඩි වීම හේතු වී තිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) 2010 මාර්තු 02 දිනැති පාලක සභා රැස්වීමට අනුව, යෝජිත ගොඩනැගිල්ලේ කෙටුම්පත් ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් නිරීක්ෂණය නොවීය.

(ආ) 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනතේ 32 පරිච්ඡේදයේ 3(1) ඡේදය ප්‍රකාරව ආයතනය විසින් සාමාජික ගාස්තු අයකරනු ලැබේ. වර්තමාන මිල මට්ටම සලකා බලා ගාස්තු සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2010 සැප්තැම්බර් 29 දිනැති පාලක සභා රැස්වීමට අනුව ආයතනයේ වෙබ් අඩවිය වෙබ් අඩවි නිර්මාණකරුවකු යොදා යාවත්කාලීන කළ යුතු වුවත්, 2010 වර්ෂය තුලදී යාවත්කාලීන කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) යහසාධක අරමුදලට අදාල ජංගම ගිණුමෙහි රු.320,000 ක් ආයෝජනය කිරීමකින් තොරව පැවතුණි.

(ඉ) 2010 ජනවාරි 19 දිනැති පාලක සභා රැස්වීමට අනුව සාමාජිකයන්ට හැදුනුම් පත් නිකුත් කළ යුතුය. කෙසේ වුවද මෙම අවශ්‍යතාවය සඳහා කිසිදු ප්‍රගතියක් සමාලෝචිත වර්ෂය තුල නිරීක්ෂණය නොවීය.

(ඊ) 2010 ජනවාරි 19 දින හා 2010 අගෝස්තු 30 දිනැති පාලක සභා රැස්වීමට අනුව සාමාජිකයන්ගේ නාමාවලිය, සාමාජිකයන්ගේ ඉල්ලුම්පත්‍ර වල ඉදිරිපත් කර ඇති විස්තර උපයෝගී කරගෙන 2010 සැප්තැම්බර් මස අවසාන වීමට පෙර සම්පූර්ණ කළ යුතු වුවත් එහි කටයුතු අවසන් කර නොතිබුණි.

(උ) 2010 වර්ෂය තුලදී ගණ පූර්ණය නොමැති වීම නිසා සාමාජික රැස්වීම් 04 ක් අවලංගු කර තිබුණි.

## 2.3 ගිණුම් වාර්තා පවත්වා ගැනීම

2010 වර්ෂය සඳහා ආයතනයේ ගනුදෙනු වලට අදාල ලෙජර් ගිණුම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.

## 2.4 <u>කාර්ය සාධන සමාලෝචනය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව පහත අරමුණු සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි.

(i) පුස්තකාල පිහිටුවීම හා පවත්වාගෙන යාම මගින් තක්සේරු විද්‍යාවට අදාල හෝ සම්බන්ධ දැනුම ලබාගැනීම ,ව්‍යාප්ත කිරීම හා නුවමාරු කිරීම ප්‍රවර්ධනය සඳහා.

(ii) ආයතනයේ සාමාජිකත්වය සඳහා යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හෝ පැවැත්වීමට විධිවිධාන සැලැස්වීම, එම පරීක්ෂණ සඳහා අධ්‍යයන පාඨමාලා සැපයීම හෝ අනුමත කිරීම හා එහි ලා කථිකාචාර්යවරුන් හා පරීක්ෂකවරුන් යෙදවීම හා ඔවුන්ගේ වේතන ගෙවීමට.

(iii) ශිෂ්‍යත්ව, අනුශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීමට.

(iv) දත්ත බැංකුව ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම ඇතුළු ක්‍රියාමාර්ග අවශ්‍ය පරිදි ශ්‍රී ලංකා තක්සේරුකරණ වෘත්තියේ නියැලෙන්නන්ගේ ප්‍රතිලාභය හා අභිවෘද්ධිය සඳහා ගැනීමට.

(ආ) ආයතනය විසින් 2010 වර්ෂය තුලදී සම්මන්ත්‍රණ 03 ක් පමණක් පවත්වා තිබුණි. මේ සඳහා සාමාජිකයන්ගේ සහභාගීත්වය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

## 3. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයා වෙත වරින් වර යොමු කරන ලදි.

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) සාමාජික ගාස්තු

(ඇ) මූල්‍ය කළමනාකරණය

(ඈ) ආදායම්

(ඉ) සම්මන්ත්‍රණ පැවැත්වීම